

# Little girl & her father
# කුඩා දියණිය සහ ඇගේ පියා

A little girl and her father were crossing a bridge.

The father was kind of scared so he asked his little daughter, " Sweetheart, please hold my hand, so that you don't fall into the river."

The little girl said, " No, dad. You hold my hand."

" What's the difference?" asked the puzzled father.

" There's a big difference," replied the little girl. " Dad, if I hold your hand and something happens to me, chances are that I may let your hand go.... But if you hold my hand, I know for sure that no matter what happens, you will never let my hand go."

දිනක් කුඩා දැරියක් සහ ඇගේ පියා, අතිනත අල්ලාගෙන, ගඟක් හරහා තිබුණු ඉතා අබලන්වූ පටු පාලමක් මතින් හෙමින් පරෙස්සමෙන් අඩි තබමින්, අමාරුවෙන් අනෙක් පැත්තට යමින් සිටියහ. පියා ඇයට මෙසේ කීවේය.

" දුවේ මගේ තදින් අල්ල ගන්න.... නැත්නම් ඔයා කකුල ලිස්සලා ගඟට වැටෙන්න පුළුවන්...."

" නෑ... තාත්තෙ, තාත්ත මගේ අත අල්ල ගන්න...." දැරිය කීවා ය.

" මොකක්ද ළමයො ඉතින් ඒකෙ වෙනස..? " පැටලිලි සහිත සිතින් පියා විමසුවේ ය.

" මේකයි තාත්තෙ.... මම තාත්තගෙ අත අල්ලගෙන හිටියොත්, ලිස්සලා යන්න ගියොත්, මගේ අත අතහැරෙන්න පුළුවන්.... ඒත් තාත්ත මගේ අත අල්ලගෙන හිටියොත්, මම දන්නවා... මොනව වුනත්, තාත්ත කීයටවත් මගේ අත අතහරින්නෙ නැති බව...."

♦ *Deepa Sandamali Herath* **දීපා සඳමාලි හේරත් USA**



# රත්තරන් පිහිය වුනත් ඇනගත්තොත්....... ?



ලංකාවෙ මේ දවස්වල සැහෙන්න කලබලකාරී තත්වයක් තියෙන්නෙ. ඒ වගක් වැඩිය නෙපෙනුනාට එහේ මිනිස්සුන්ගෙ කතාබහ යොමු වෙලා තියෙන්නෙ ලබන ජනවාරි මාසෙ පැවැත්වෙන ජනාධිපති තරඟය ගැන. වෙන ජනපතිවරණවලට වැඩිය මේ පාර අමුත්තක් තියනවා. ඒ තමයි හිටපු හමුදාපති සරත් පොන්සේකා මහත්තෙයා තරඟෙට බැහැලා ඉන්න එක. මේ ගැන පුද්ගලිකවත්, පත්තර රූපවාහිනී මාධ්‍යයෙනුත් එක එක්කෙනා දක්වන කාරණා කියුම් බොහොමයි. ඡන්දය දාන්න බැරිවුනත්, වෙලේගෙදර රාළ වන මටත් හිතුණා මෙහේ ඉඳ ගෙන, මේ දේවල් දිහා මගේ පැත්තෙන් බලලා යමක් ලියන්න.

බෞද්ධයෙක් හැටියට මම හේතුඵලවාදය විස්වාස කරනවා. හේතුවක් නැතුව කිසි දෙයක් සිද්ධ වෙන්නෙ නැහැ. හැම දේකටම හේතුවක් තියනවා. සරත් පොන්සේකා මහත්තෙයා හමුදාපති වශයෙන් අපේ රටේ තිබුණු දරුණුම ත්‍රස්තවාදය සුන්කරන්න මූලික වුණු කෙනෙක් හැටියට අපි විතරක් නෙවෙයි මුළුමහත් ලෝකයාම පිළිගන්නවා. ඒ ලැබිය යුතු ගෞරවය හා පැසසුම් එතුමාට ජනතාවද, රජයද දැක්වූ හැටි අපි කවුරුත් දැක්කා. ඒක බොරුය කියලා කියන්න බැහැ. ඒත් ඒ දුන්නු ගෞරවය මදිය කියන හැඟීමක් පොන්සේකා මහතාගේ හිතේ තිබෙන බවත්, ඒ නිසාම එතුමා ඉතා අසංතෝසයෙන් ඉන්නා බවත්, යුද්ධය අහවර වෙච්ච ගමන්ම වගේ ලංකාවෙ රජයට එරෙහි වෙබ් අඩවියක පළවුණා මම දැක්කා. ඒ මාස හතරකට පහකට උඩදි. එතකොට මේ ජනපතිවරණ ගැන ලංකාවෙ කිසි කෙනෙක් කතා කළේවත් නැති කාලෙක. එදා තමයි මං කල්පනා කළේ මේ වෙබ් අඩවියෙන් කරන්නෙ කෙටවීමක් නේදැයි කියලා. ඒත් පොන්සේකා මහත්තෙයා ඒ ලණුව කාවිය කියලා මම හීනෙකින්වත් හිතුවෙ නැහැ.

ඒ එක්කම කොහේදෝ යන නක්ෂත්‍රකාරයෙක් තව ලණුවක් දුන්නා, " හමුදාපති තුමනි! ඔබතුමාට රාජයෝගයක් තියනවා. මේක කිසි කෙනෙකුට මේ සම්ම ජාතියේදි වළක්වන්න බැහැ. ඉහළම පුටුවෙ වාඩිවෙලා තමයි නවතින්නෙ" කියලා.

මෙන්න මෙතෙන්දි තමයි මම දෙකයි දෙකයි හතරයි කියලා ගණන හදලා බැලුවෙ. මේ කිසි දෙයක් නිකම් සිද්ධවුණා නෙවෙයි. අර වෙබ්අඩවියත්, මේ සාස්තරකාරයත් දෙන්නම පිටස්තර බලපෑමක වැඩ. දැන් වටවෙලා ඉන්න රනිල් වික්‍රමසිංහ මංගල සමරවීර, රවුප් හකීම්, මනෝ ගනේෂන් වගේ අය දැක්කම හිතාගන්න ඇහැකි මේ හැමදේකම සැලැස්මක් තිබුණායි කියලා. කොහොම හරි ඔන්න බළලා ලිප ළඟටම ගෙනාවා.

කට්ටියක් ආණ්ඩුවට තවමත් බනිනවා රණවිරුවෙකුට සලකපු හැටි හරි නැත කියලා. කට්ටියක් පොන්සේකා උන් නැහෙගෙන් අහනවා කන්න දීපු අත හපාකන එක හරිද කියලා. ඒ සේරටම වැඩිය විපක්ෂය හිතාගෙන ඉන්නවා රජය වට්ටලා ඒ අය බලයට එන්න. ඒ ආවම ජනාධිපති වෙන්නෙ කවුද? අගමැති වෙන්නෙ කවුද? කියලා දැනටම ඒ ගොල්ල තීන්දු කරලා. ඒක හොඳයි, පස්සෙ කෙළගන්නවට වැඩිය දැනටම වැඩේ තීන්දු කරගත්තම. හැබැයි ඒ ආවොත් නේ. මේ සේරම අස්සෙ එල්ටීටීඊ කාරයො හිතනවා, මෙන්න බොලේ අපිට ආයිත් අළුගසා දාලා නැගිටින්න මරු චාන්ස් එකක් එනවා කියලා.

මම ආයිත් එන්න කැමතියි මුලින් සඳහන් කරපු හේතුඵල කතාවට. මේ සේරම දේවල් කොටින්ගෙන් හරි, අභ්‍යන්තර සතුරන්ගෙන් හරි, ජාත්‍යන්තර බලපෑමෙන් හරි, කොයි විදියට හරි සිද්ධ වෙන්න පුළුවන් වුණාට තව මූලික කාරණයක් තියනවා. ඒ තමයි, සරත් පොන්සේකාට හමුදාපති වුණා වගේ ලංකාවෙ ජනාධිපති වෙන්නත් ආසාවක් කාලයක් ඉඳලා තිබුණද නැද්ද කියන එක. මේව ගහෙන් ගෙඩි එන්න වගේ හිටිහැටියෙ එන දේවල් නෙවෙයි. අන්න ඒ ගැන හිතුවොත් පේනවා ඒ කාර්‍ය්‍යය ඉෂ්ට වුණොත් හමුදාව හසුරවපු කෙනෙක් සිවිල් සමාජයක් හසුරවන්න ගියොත් ඒක මොන විදියට කරාවිද කියන එක. සිවිල් වැසියො හැටියට ලංකාවෙ මහජනතාව ඒ ගැන දැඩි ලෙස සිතිය යුතුය කියලයි මම හිතන්නෙ.

සරත් පොන්සේකා මහත්තෙයා කාර්යක්ෂම යුද නිලධාරියෙක් බව හැබෑව. ශ්‍රීලංකා හමුදාවන්ට අවශ්‍ය වෙලා වෙදි අවශ්‍ය නායකත්වය දීලා ලොව බිහිසුණුම ත්‍රස්තවාදී කණ්ඩායමක් සහමුලින්ම නැති හංග කළා. රට ආයිත් ආරක්ෂක ස්ථානයක් කරන්න මූලික වුණා. ඒ වුනාට ඒ නිසාම එයා රටේ නායකයා වෙන්න සුදුසුය කියලා මං හිතන්නෙ නැහැ. එදාට සිද්ධ වෙන්නෙ ඔය හිතන දේවල් නෙවෙයි. සිංහල කියමනක් තියනවා රත්තරන් පිහිය වුනත් ඇනගන්න එපා කියලා. ඒක හුඟක් වටින බව ඇත්ත. හැබැයි ඒකෙන් ඇන්නොත් සාමාන්‍ය පිහියකින් ඇන්න වගේම තමයි. නෝ චාන්ස්! ඒ නිසා ඒක ඔය තියන විදියට නිසි ගෞරවය ඇතුව තියෙන්න අරින්න. එච්චරයි!

♦ **වෙලේගෙදර රාළ London**

# දිල්ෂාන්ට කළුතර විද්‍යාලීය උපහාර
## Dilshan felicitated by Kalutara Vidyalaya





*තිලකරත්න දිල්ෂාන්, ජවිපෙ නායක සෝමවංශ අමරසිංහ, ක්‍රිකට් උපදේශක සහ ලේඛක රන්ජන් පරණවිතාන (මැද) උත්සවය ආරම්භයේ පහන දල්වන්නට සැරසෙමින්*

ICC Twenty 20 player of the year - **TILAKARATNE DILSHAN** was felicitated by **Kalutara Vidyalaya Past Cricketers Foundation** on their recent annual get together held at Tangerine Beach Hotel in Kalutara North. Dilshan was a student of Kalutara Vidyalaya and started his cricket carrier there.

Kalutara Vidyalaya past cricketer and the present leader of Janatha Vimukthi Peramuna, Mr Somawansa Amarasinghe was also present at the ceremony.

Major General Nissan Wijesinghe, the president of Kalutara Vidyalaya Past Cricketers Foundation and N.Y. Karunaratne, the president of Kalutara Vidyalaya OBU, gave awards to Dilshan.

The principal of Kalutara Vidyalaya, Dilshan's school cricket coach and sports writer Ranjan Paranavithana and the Western Province Sports minister Upali Kodikara also parcitipated.

අද ජාත්‍යන්තර වශයෙන් කීර්තියක් උසුළන, එමෙන්ම මේ වසරේ **20/20** ක්‍රිකට් තරඟාවලියේ හොඳම ක්‍රීඩකයා ලෙස තේරුණු ශ්‍රීලංකා ජනප්‍රිය ක්‍රිකට් ක්‍රීඩක තිලකරත්න දිල්ෂාන්ට උපහාර පිරිනැමීමක් පසුගිය දා කළුතර මහා විද්‍යාලීය ක්‍රිකට් පදනම මගින් සංවිධානය කර තිබිණ. දිල්ෂාන් කළුතර මහා විද්‍යාලයේ ආදි ශිෂ්‍යයෙකු වන අතර ඔහු ක්‍රීඩාවට මුලින් අතපොත් තැබුවේත් හුරු වූයේත් එහි දී ය.

මෙම උත්සවය පැවතියේ උතුරු කළුතර ටැන්ජරීන් බීච් හෝටලයේය.

කළුතර මහා විද්‍යාලයේ ආදි ශිෂ්‍යයෙකු මෙන්ම දක්ෂ ක්‍රිකට් ක්‍රීඩකයෙකු ද වන ජනතා විමුක්ති පෙරමුණේ වත්මන් නායක සෝමවංශ අමරසිංහ මහතා ද සහභාගි වී සිටියේය.

මේජර් ජෙනරාල් නිශ්ශංක විජේසිංහ සහ එන්. වයි. කරුණාරත්න යන මහතුන් දිල්ෂාන්ට සම්මාන පිරිනැමූහ.

කළුතර විද්‍යාලයේ ප්‍රධානාචාර්‍ය්‍ය තුමාද, දිල්ෂාන්ගේ විද්‍යාලීය ක්‍රිකට් පුහුණුකරු මෙන්ම ජනප්‍රිය ක්‍රීඩා ලේඛක රන්ජන් පරණවිතාන සහ බස්නාහිර පළාතේ ක්‍රීඩා ඇමති උපාලි කොඩිකාර යන මහත්වරුද සහභාගිවූහ.

# සැබෑ ජාතික කොඩිය යළිත්!



*තිරු සහිත මේ හරි කොඩියද? නැද්ද?*

ශ්‍රීලංකා ජාතික ධජය පිළිබඳව කලක් තිස්සේ විවිධ මතිමතාන්තර පළවෙමින් ඇත. බොහෝ දේශප්‍රේමීන් කියන්නේ වර්තමානයේ පවතින කොඩිය සැබෑ කොඩියක් නොව පැරණි සිංහළ කොඩිය දේශපාලකයින්ට අවශ්‍ය පරිදි වෙනස් කර සකස්කරගන්නා ලද ව්‍යාජ කොඩියක් බවයි. පුරාණ සිංහළ රජ දවසේ පටන් පැවති සැබෑ ධජය නැවත ස්ථාපනය කළ යුතු බව ඔවුන්ගේ අදහසයි.

පසුගියදා ශ්‍රීලංකා ජාතික කොඩිය පිළිබඳ සාකච්ඡා සභාවක් කොළඹ සමස්ථ ලංකා බෞද්ධ සම්මේලන ශාලාවේ පැවැත්විණ. එයට වජිරාරාම වාසී පූජ්‍ය කඹුරුගමුවේ මහානාග තෙරුන්, පූජ්‍ය අහංගම ආනන්ද තෙරුන්, ශ්‍රීලංකා මුස්ලිම් සාම මණ්ඩලයේ ගරු අල්හාජ් නියාස් මව්ලාවි තුමා සහ කලාසූරි අරිසෙන් අහුබුදු ශූරීන්ද සහභාගි වූහ.

ආරම්භක කථාව කළ ගාල්ලගේ පුණ්‍යවර්ධන මහතා පැවසුවේ ශ්‍රීලංකාව යටත් කරගත් බ්‍රිතාන්‍යය ශ්‍රීලංකාවේ සියළු දේ සිය පාලනය යටතට ගනිමින් නිදහස ලැබුණාට පසුත් ජාතික කොඩියට පවා අමතර තීරු දෙකක් රිංගවා පැරණි කොඩිය විකෘති කළ බවයි.

අල්හාජ් නියාස් මව්ලාවිතුමා පැවසුවේ අමතර තීරුදෙකෙන් සුළු ජාතීන් නියෝජනයවීම කෙසේ වෙතත් ඉන් සුළු ජාතීන් සිරකර තබා ඇති බවක් හැඟෙන බවයි. ඒ නිසා ඒ තීරු අනවශ්‍ය බවත් පැරණි කොඩියම ගෙන ආ යුතු බවත් එතුමා කීය.

ජාතියකට ඓතිහාසික කොඩියක ඇති වටිනාකම අහංගම ආනන්ද හිමියෝ සභාවට පෙන්වා දුන්හ.